# ශ්‍රී ලාංකේය බහුවාර්ගික සමාජය තුළ සාමය ස්ථාපිත කිරීම සඳහා උචිත පුරවැසි අධ්‍යාපනයක ස්වභාවය විමසීම.

(වයඹ පළාත, උතුරු-නැගෙනහිර පළාත් හා මාතලේ

අධ්‍යාපන කලාපය ඇසුරෙනි)

ජේ. ඒ. එන්. ප්‍රේමතිලක

ශාස්ත්‍රවේදී

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (විශිෂ්ඨ)

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ අධ්‍යාපන දර්ශනපති

උපාධිය සඳහා ඉදිරිපත් කරනු ලබන

නිබන්ධනය.

1998 ජුනි

UCLIB

480860

## සංක්ෂේපය

පර්යේෂකයා මෙම පර්යේෂණය තුළින් වර්තමානයේ මෙරට මුහුණදී තිබෙන බැරෑරුම් ගැටළුවක් කෙරෙහි සිය අවධානය යොමු කර තිබේ. වාර්ගික ජන කොටස් අතර, සාමය ස්ථාපිත කිරීමත් මිත්‍රත්වය හා අවබෝධය දියුණු කිරීමත්, මෙරට අනාගත අභිවෘද්ධිය උදෙසා අත්‍යාවශ්‍ය වන බව පැහැදිලි කරුණකි. මේ සඳහා විධිමත් අධ්‍යාපනය තුළින් ඉටු කළහැකි කාර්යභාරය කෙරෙහි උනන්දුවක් ද ඇතිවී තිබෙන බැව් පෙනී යයි. එබැවින් විධිමත් අධ්‍යාපනය මස්සේ බහු වාර්ගික සමාජය තුළ සාමය ස්ථාපිත කිරීම සඳහා උචිතවූ පුරවැසි අධ්‍යාපනයක ස්වභාවය විමසා බැලීම මෙම අධ්‍යයනයේ පරමාර්ථය විය.

නිබන්ධනයේ පළමු පරිච්ඡේදය යටතේ මානව ඉතිහාසය පුරා පැතිර තිබූ ගැටුම් හා යුද්ධ කෙරෙහි අවධානය යොමු කෙරිණි. එසේම වරින්වර ඇතිවූ "සාමය" මගින් ඉටු කරන ලද කාර්යභාරය පිළිබඳව ද ඇගයීමක් සිදුකොට ඇත. ශ්‍රී ලංකාවේ විවිධ ජන කොටස් අතර අතීතයේ පැවති ගැටුම් මෙන්ම සහජීවනයද සාකච්ඡාවට භාජනය කෙරිණි. ශ්‍රී ලංකාවට දේශපාලන නිදහස ලැබීමෙන් පසු මෙරට විටින් විට ඇතිවූ සාමය බිඳවැටීම් කෙරෙහි ද මෙරට ජනකොටස් අතර අන්‍යෝන්‍ය අවිශ්වාසය ක්‍රමයෙන් වර්ධනය වූ ආකාරය හා වර්තමාන ජවාර්ගික යුද්ධය දක්වා වර්ධනයවූ ආකාරය පිළිබඳවද සළකා බැලිණි. මෙම අධ්‍යයනයේ අරමුණු ද මෙහි දැක්වේ.

දෙවන පරිච්ඡේදයේදී "සාමය " යනු කුමක් දැයි විග්‍රහ කර තිබේ. සාමය හා සමාජයේ විවිධ ක්ෂේත්‍ර අතර ඇති සම්බන්ධතාවයද පෙන්වා දෙනු ලබයි. විශේෂයෙන් මෙරට සාමය ස්ථාපිත කිරීම සඳහා මෙතෙක් අනුගමනය කර ඇති දේශපාලනික ක්‍රියාමාර්ග කෙරෙහි ද අවධානය යොමු කෙරිණි. විවිධ ආගමික දෘෂ්ටිකෝණ තුළින් " සාමය " පරීක්ෂාවට භාජනය කර තිබෙන අතර, සාමය හා පුරවැසි අධ්‍යාපනය පිළිබඳව ලියවී ඇති සාහිත්‍යය කෙරෙහි ද අවධානය යොමු විය. සාමය හා අධ්‍යාපනය අතර සම්බන්ධයද, සාකච්ඡාවට භාජනය විය.

University of Colombo Library Sri Lanka

තෙවන පරිච්ඡේදයේදී රටක සමාජය හා එහි පුරවැසියාගේ ස්වභාවයද පරීක්ෂාවට ලක්විය. පුරවැසියා නම් කවරෙක්ද? එදා හා අද පුරවැසියා තුලනාත්මකව පරීක්ෂාවට භාජනයකර ඇති අතර, යහපත් පුරවැසි භාවය ලැබෙන්නේ කෙසේද? යන්න පිළිබඳවද විමසා බැලිනි. යහපත් පුරවැසියකුගේ ස්වභාවයද සාකච්ඡාවට භාජනය විය. ශ්‍රී ලංකාවේ පුරවැසියා පිළිබඳව මෙන්ම ඔහුගේ යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳවද ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අනුව පැහැදිලි කෙරෙයි. විවිධ පුද්ගල කණ්ඩායම් සමාජයට බාධාවන ආකාරයට කටයුතු කරනු ලබන විවිධ සාධක කෙරෙහි ද අවධානය යොමු කෙරිණි.

පර්යේෂණය සඳහා යොදා ගත් නියැදි හා පර්යේෂණ ක්‍රමශිල්ප පිළිබඳව හතරවන පරිච්ඡේදය තුළින් විස්තර කෙරෙයි. ලබා ගත් දත්ත විශ්ලේෂණය කර ඇති අතර, පර්යේෂකයාට මෙම පර්යේෂණයේදී යටත් වීමට සිදුවූ සීමාවන් ද එහි දක්වා තිබේ.

සමාජ ස්ථාපිත කිරීම සඳහා යෝග්‍යවූ පුරවැසි අධ්‍යාපනයක් කෙරෙහි ගුරුවරුන්ගේ ආකල්ප විමසා බැලීමක් පස්වන පරිච්ඡේදය තුළින් සිදු විය. එවැනි අධ්‍යාපනික වැඩසටහනක් ක්‍රියාවට නැංවීමේදී හා එහි ප්‍රතිඵල ලබා ගැනීම සම්බන්ධව ගුරු ආකල්ප බලපාන ආකාරය පිළිබඳව ද විමසීමක් සිදු කොට ඇත.

හයවන පරිච්ඡේදය තුළින් වර්තමාන "I වසර සිට II වසර දක්වාවූ විෂයමාලාවන් කෙතෙක් දුරට සමාජය ස්ථාපිත කරවීම සඳහා දායකවී ඇත්දැයි යන්න ලුහුඬින් විමසා බැලෙයි. එසේම ඒ සඳහා යෝග්‍යවන පාසල් විෂයමාලාවක් කෙබඳු ස්වභාවයක් ගතයුතුද යන්න පරීක්ෂාවට භාජනය විය. එවැන්නක අන්තර්ගතය පිළිබඳව ද අවධානය යොමු විය.

පර්යේෂකයා තම සමීක්ෂණයේ දත්ත විශ්ලේෂණය කිරීමෙන් එළඹි නිගමන හා යෝජනාවන් හත්වන පරිච්ඡේදයෙන් ඉදිරිපත්කර තිබේ. අවසානයේදී අනාගත පර්යේෂකයන් සඳහා වූ මඟපෙන්වීමක් ද සිදු කෙරෙයි.